ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2012/11/21 |

## ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර පවත්වා ගෙන යාම සඳහා පියවරෙන් පියවරට අවශ්‍ය වන මාර්ගෝපදේශය

ශ්‍රී ලංකා මහ බැංකුව "**A Step by Step Guide to Doing Business in Sri Lanka**" නමින් වන ප්‍රකාශනයේ 3 වන සංශෝධිත මුද්‍රණය නිකුත් කර ඇත. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාමට අදාළ විවිධ පියවරයන්හි දී ව්‍යවසායකයකු විසින් අනුගමනය කළ යුතු රෙගුලාසි පිළිබඳ තොරතුරු මෙම ප්‍රකාශනයේ අඩංගු වේ. 2012 ඔක්තෝබර් මාසය තෙක්, අදාළ ආයතන විසින් යෝජනා කරන ලද අවශ්‍ය සංශෝධනයන් මෙම මුද්‍රණයට ඇතුළත් කොට ඇත.

ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම; ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම; මූලික සැලසුම් නිෂ්කාශනයන් ලබා ගැනීම/ඉදිකිරීම් බලපත්‍ර ලබා ගැනීම/අනුකූලතා සහතිකය ලබාගැනීම; දේපළ ලියාපදිංචි කිරීම; දුරකථන, විදුලි සහ ජල සම්බන්ධතා ලබාගැනීම; සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට වාරික ගෙවීම; බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය ලබා ගැනීම සහ බදු ගෙවීම; වාහනයක් ලියාපදිංචි කිරීම; මහජනතාවට කොටස් නිකුත් කිරීම; බැංකු ගිණුමක්

ආරම්භ කිරීම සහ ණය ලබා ගැනීම; ආනයනය/අපනයනය කිරීම; වෙබ් අඩවියක් ලියාපදිංචි කිරීම සහ වාර්ෂික ප්‍රකාශ ඉදිරිපත් කිරීම වැනි මාතෘකා 28 ක් යටතේ මෙම ප්‍රකාශනයේ තොරතුරු සාරාංශගත කොට ඇත. තවද, විදේශ ගමන් බලපත්‍රයක් ලබා ගැනීම, ශ්‍රී ලංකාවට පැමිණීමට වීසා ලබා ගැනීම, පුරවැසි නොවන පුද්ගලයන් විසින් දේපළ මිලදී ගැනීම, කාර්මික දූෂණය පාලනය සහ නව ව්‍යාපෘතිවලට අනුමැතිය ලබාගැනීම, පොලීසිය සමග සම්බන්ධතා, ගිවිසුම් බලගැන්වීම සහ කාර්ය මණ්ඩලය සඳහා වන්දි ලබා දීම වැනි පොදු මාතෘකා යටතේ තොරතුරු සපයා ඇත. මෙම ප්‍රකාශනය පරිහරණය කරන පුද්ගලයන් හට වැඩිදුර තොරතුරු පැහැදිලි කර ගැනීමට, අවශ්‍ය නම් ඒ සඳහා එක් එක් විෂයන් යටතේ අදාළ ආයතන, ලිපිලේඛන අවශ්‍යතා, රෙගුලාසි නිෂ්කාශනය, අදාළ වියදම් සහ ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සම්බන්ධ කරගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සහ වෙබ් අඩවි ලිපිනයන් ද මෙහි ඇතුළත් වේ.

ව්‍යවසායකයන්ට අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා වන විමසුම් පිරිවැය සහ ඒ සඳහා වැය කළ යුතු කාලය මෙන්ම විසිරුණු මූලාශ්‍රවලින් තොරතුරු ලබා ගැනීමේ දී වන අපහසුතා අවම කිරීම තුළින් ව්‍යාපාරික ප්‍රජාවට සහ විදේශීය ආයෝජකයන්ට මෙම ප්‍රකාශනය ඉතා ප්‍රයෝජනවත් මූලාශ්‍රයක් වනු ඇති බව අපගේ විශ්වාසයයි.

මෙහි පිටපතක මිල රුපියල් 500 ක් වන අතර, අංක 58, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු විදු පියෙසේ විකුණුම් කවුළුවෙන් එය මිලදී ගත හැක. තවද, මෙම ප්‍රකාශනය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් (www.cbsl.gov.lk) ද ලබාගත හැක.